RARE

# ශ්‍රී ලාංකේය රූපවාහිනී මාධ්‍යයේ ඒකාංක ටෙලිනාට්‍ය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(ආනන්ද අබේනායකගේ සංසාරේ පියසටහන් ඇසුරෙන්)

ආර්.එච්. උපුල් ජයන්ත

ලියාපදිංචි අංකය : FGS/04/02/14/2013/01

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1303 |
| වර්ග අංකය: | |

දර්ශනපති උපාධිය පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධයකි.

2016 ජූනි

# සාර සංග්‍රහය

## ශ්‍රී ලාංකේය රූපවාහිනී මාධ්‍යයේ ඒකාංක ටෙලිනාට්‍ය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

## (ආනන්ද අබේනායකගේ සංසාරේ පියසටහන් ඇසුරෙන්)

වර්ෂ 1993 ඔක්තෝබර් 30 දින සිට වර්ෂ 2016 මැයි මස 21 වැනි දින දක්වා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් විකාශනය කරන ලද ආනන්ද අබේනායකගේ සංසාරේ පියසටහන් ඒකාංක ටෙලිනාට්‍ය මාලාව මෙම පර්යේෂණය සඳහා පාදක කරගත් අතර ඒකාංක ටෙලිනාට්‍යයේ ආකෘතිය හා අන්තර්ගතය සඳහා බලපෑ සාධක කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කොට ඇත. ඒ අනුව බෞද්ධ දර්ශනය පදනම් කොටගත් ඓතිහාසික ශ්‍රී ලාංකේය ඥාන සම්භාරය, සංසාරේ පියසටහන් ඒකාංක ටෙලිනාට්‍ය මාලාවේ ආකෘතිය හා අන්තර්ගතය නිර්මාණය කිරීමට බෙහෙවින් ඉවහල් වී ඇති බව මෙම පර්යේෂණයේ දී හඳුනා ගැනීමට හැකි විය. එමගින් බෞද්ධාගමික පරිසරය, එහි සමාජ බලපෑම මෙන් ම සංස්කෘතිමය වටිනාකම් අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාව පිළිබඳ සංසාරේ පියසටහන් ඒකාංක ටෙලිනාට්‍ය මාලාවට විශේෂිතව විමර්ශනය කොට ඇත.

දෙසීය තිස් හතක් (237) පමණ වන සංසාරේ පියසටහන් ඒකාංක ටෙලිනාට්‍ය නිර්මාණයන් හි භාවිත කළ විවිධ තේමා කෙරෙහි අවධානය යොමු කරමින් ඒවායේ විශද වන ආකෘති හා අන්තර්ගත ලක්ෂණ සනිදර්ශන ව විමසුමට බඳුන් කොට තිබේ. නමුදු සංසාරේ පියසටහන් ඒකාංක ටෙලිනාට්‍ය මාලාවේ සමස්ත ඒකාංක වෙන් වෙන් වශයෙන් විමර්ශනයට බඳුන් කළ නො හැකි හෙයින් දේශීය හා විදේශීය සම්මාන උළෙල මගින් ඇගයීමට ලක් වූ ඒකාංක ටෙලිනාට්‍ය කිහිපයක් නියැදි වශයෙන් ගෙන ඒවා විග්‍රහයට බඳුන් කිරීමට ප්‍රයත්න දැරීය. එහි දී ප්‍රධාන වශයෙන් තෝරාගත් ඒකාංක ටෙලිනාට්‍ය හතක් කේවල වශයෙන් විමර්ශනයට බඳුන් කෙරේ. ඇතැම් ඒකාංක ටෙලිනාට්‍ය නිර්මාණ සංරක්ෂණය කොට නො මැති හෙයින් සම්මානයට බඳුන් නො වූ එහෙත් විවිධ ආකෘති හා අන්තර්ගතමය වශයෙන් වෙනස්කම් සහිත නිර්මාණාත්මක ටෙලිනාට්‍ය මේ සඳහා භාවිත කොට ඇති බව ද මෙහි ලා සඳහන් කළ යුතු වේ. එබඳු ඒකාංක ටෙලිනාට්‍ය නිර්මාණ අන්තර්ජාතික වශයෙන් ශ්‍රී ලාංකේය අනන්‍යතා ව ප්‍රදර්ශනය කිරීම උදෙසා භාවිත කළ

හැකි වන්නේ එමගින් පොදු මානවීය ගුණාංග නිර්මාණකරණයට පදනම් කොට ඇති හෙයිනි. බුදුසමයාගත විශිෂ්ට චින්තනය සූක්ෂම අයුරින් සංසාරේ පියසටහන් සඳහා අන්තර්ගත කොට ඇති අතර මෙම පර්යේෂණයේ දී භාවිත කළ ඒකාංක ටෙලිනාට්‍ය නිර්මාණ ඒ සඳහා නිදර්ශන සපයනු ලැබේ.

**ප්‍රමුඛ පද** : ඒකාංක ටෙලිනාට්‍ය, ටෙලිනාට්‍ය, සංසාරේ පියසටහන්, ආනන්ද අබේනායක, බුදුසමය

**A Critical Analysis of Single Episode Tele drama in Sri Lanka.**

(with Reference to Sanārē Piyasatahan of Ananda Abenayake)

The subject of this thesis is a study of the series of single episode Tele-dramas of Ananda Abenayake that were telecast from 30th October 1993 to 21st May 2016. Special focus would be on the criteria that had an impact on the plot construction and the subject matter in the respective dramas. It was identified through analytical evaluation of the main factor that shaped the plot construction and content was the wisdom gained by the Buddhist Philosophy in the Sri Lankan context throughout the years. The results proved the extent of influence created by Buddhism in formatting the social and cultural values. The tele-dramas included in the series had been created with the purpose of impregnating the modern society with positive values. Hence the study was intent on the observation of the techniques used in each drama with a different content. There were 237 dramas in the series which made it necessary to select from them what should be taken as examples for the final document. The main focus were the dramas that had won local and international awards. And the next were the dramas that had used unusual content or subject matter making them 'special' and out of the ordinary. The examples were limited to seven in number. It was also observed that the tele-dramas in the series could also take Sri Lankan identity to the international level. The reason being that, while representing Sri Lanka they rise above the limits of a single country since the subject matter deals with the whole of humanity.

Key words : Single Episode, Tele-drama, Sanārē Piyasatahan, Ananda Abenayake, Buddhism